# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2320/56 – 2023 පෙබරවාරි 22 වැනි මස බදාදා – 2023.02.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමු පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, දැරණියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අටුලුගම් කෝරළේ නැගෙනහිර සුළු කොට්ඨාසයේ, දැරණියගල දකුණ යන ගමේ පිහිටි ප්‍රගමණ අනුරේඛනයේ අංක KE/DRN/2010/152 හා 2010.11.19 දිනැති ප්‍රමාණයෙන් හෙක්. 1.2397ක් පමණ වන ප්‍රමාණවලින් හා නම්වලින් යුත් ඉඩම් කැබලිවලට මායිම් :

01. **කැබලි අංක 1** - කැබෙල්ලලන්ද - **ප්‍රමාණයඃ හෙක්. 0.0992 ක් පමණ**
උතුරට: අ.ග.පි. 621 හි කැබලි අංක 459 සහ කුඹුරුගන් ඔය; නැගෙනහිරට: අ.ග.පි. 621 හි කැබලි අංක 459 සහ මාර්ගය; දකුණට: මාර්ගය සහ අ.ග.පි. 621 හි කැබලි අංක 1533; බටහිරට: කුඹුරුගන් ඔය සහ අ.ග.පි. 621 හි කැබලි අංක 1533.

02. **කැබලි අංක 2** - **ප්‍රමාණයඃ හෙක්. 0.0458 ක් පමණ**
උතුරට, නැගෙනහිරට, දකුණට, බටහිරට: -

03. **කැබලි අංක 3** - කැබෙල්ලලන්ද - **ප්‍රමාණයඃ හෙක්. 1.0947 ක් පමණ**
උතුරට: අ.ග.පි. 621 හි කැබලි අංක 459 සහ කැබලි අංක 1533; නැගෙනහිරට: අ.ග.පි. 621 හි කැබලි අංක 1533,1608,1609,1613, සහ 1614; දකුණට: අ.ග.පි. 621 හි කැබලි අංක 1614 සහ මාර්ගය; බටහිරට: මාර්ගය.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: LD/05/2010/VE/75.
2022 නොවැම්බර් මස 11 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 02-0261


1A – G 38931 – 09 (2023/02)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*